ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

ගිණුම්කරණය 13ශ්‍රේණිය

I කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමිවේ. මුළු ලකුණු 100 කි.
- අංක 01 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයකට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) පහත කුමන ප්‍රකාශනයෙන් ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද?

(1) ආයතනයක ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
(2) ආයතනයක ගනුදෙනු මූලික වාර්තා පිළියෙල කිරීම සඳහා සටහන් කිරීම
(3) ආයතනයක මූල්‍ය වාර්තා ගිණුම්කරණ ප්‍රමිත පදනම්ව පිළියෙල කිරීම
(4) ආයතනය පිළිබඳ තොරතුරු කළමණාකරුවන්ට තිරණ ගැනීම සඳහා සන්නිවේදනය කිරීම
(5) ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනිම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම

02) ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවක් නිසා ඇතිවූ බලපෑම ගිණුම්කරණ සමීකරණය තුළින් පහත දැකවෙන පරිදි නිරූපණය වේ.

වත්කම්	=	වගකීම්	+ හිමිකම්
70 000	=	0	+ (5000)
(75 000)			

මෙයින් නිරූපණය වන ගණුදෙනුව වන්නේ,

(A) පිරිවැය රු. 75000 ක භාණ්ඩ රු. 70000කට ණයට විකිණීම.
(B) ධාරණ අගය රු. 75000 ක දේපල රු. 70000 කට අත්පිට විකිණීම.
(C) ණයගැති රු. 75000 ක් සඳහා මුදල් ලැබීමේදී රු. 5000 ක වට්ටමක් ලබා දීම.
(D) රු. 75000 ක වත්කමක් රු. 70000කට මුදලට ගැනීම.
(E) රු. 5000 ක VAT බදු ගෙවා රු. 75000 ක තොග අත්පිට ගැනීම.

(1) E පමණි (2) B හා D පමණි (3) A ,B හා D පමණි
(4) A හා B පමණි (5) A ,B හා C පමණි

03) ව්‍යාපාරයක පහත ගණුදෙනු වාර්තා කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලේඛන වල අනුපිළිවෙල වන්නේ,

(A) අඩමාණ ණය ලියා හැරීම
(B) හිමිකරු තම පෞද්ගලික මෝටර් රථය ව්‍යාපාරයට යෙදවීම
(C) අත්පිට මුදලට භාණ්ඩ විකිණීම
(D) නැවත විකිණීමට ණයට මිලදී ගත් භාණ්ඩ සැපයුම්කරුවෙකුට යැවීම

(1) ජර්නල් වවුචරය/ විකුණුම් ඉන්වොයිසිය/ හරපත් / ජර්නල් වවුචරය
(2) ජ්ර්නල් වවුචරය / ජ්ර්නල් වවුචරය/ ලදුපත / හරපත
(3) ජර්නල් වවුචරය / ලදුපත / විකුණුම් ඉන්වොයිසිය / හරපත
(4) ජර්නල් වවුචරය / ජර්නල් වවුචරය / හරපත / ලදුපත
(5) හරපත / ජර්නල් වවුචරය / ලදුපත / විකුණුම් ඉන්වොයිසිය

04) මූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුළ නොඉපැයූ ආදායම් හඳුනා ගැනිම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනමක් සපයයිද?

(1)උපචිත (2)ඓතිහාසික පිරිවැය (3)උපලබ්ධි (4)ආරක්ෂණ (5)අඛණ්ඩ පැවැත්ම

05) මූල්‍ය ප්‍රකාශන වල ණයගැතියන් සහ ණයහිමියන් හඳුනා ගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේද?

(1)උපචිත (2)ඒකක (3)කාලච්ඡේද (4)ගැළපුම් (5)උපලබ්ධි

06) 2018.12.31 දිනට සීමිත රොමාල් පොදු සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදි. පසුව කරන ලද විමර්ශනයකදී පහත දෑ හෙළිදරව් විය.

- වැටුප් සඳහා ගෙවූ රු. 100 000 ක් මුදල් පාලන ගිණුමේ පමණක් සටහන් කර තිබුණි.
- ණයහිමියෙකුට ගෙවන ලද රු. 25 000 ක් ණයගැති පාලන ගිණුමේ මුදල් ලැබීම් ලෙස සටහන් කර තිබුණි.
- විකුණුම් ජර්නලය රු. 30 000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.
- බොල් ණය කපා හැරීම් රු. 20 000 ක් ආදායමක් ලෙස සටහන් කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

(1)රු. 145 000 හර (2)රු. 145 000 බැර (3)රු. 190 000 හර (4)රු. 190 000 බැර (5)රු. 220 000 බැර

07) පහත සඳහන් තොරතුරු නිසි පරිදි ගිණුම් පවත්වාගෙන නොයෙන තනි පුද්ගල ව්‍යාපාරයක ගිණුම්පොත් වලින් උපුටා ගන්නා ලදි,

- ආරම්භක තොගය රු. 170 000
- අවසාන තොගය රු. 180 000
- ගැණුම් රු. 700 000
- ආපසු යැවුම් රු. 90 000

දළ ලාභ අනුපාතය විකුණුම් මත 40% කි. මෙම කාලච්ඡේදයේ විකුණුම් අගය වන්නේ,

(1)රු. 600 000 (2)රු. 840 000 (3)රු. 1 000 000 (4)රු. 1 400 000 (5)රු. 1 600 000

08) ව්‍යාපාරයක 2017.03.31 අවසාන තොගය රු. 60 000 ක් අධිතක්සේරු ගතව තිබුණි. 2018.03.31 අවසාන තොගය රු. 10 000 ක් අවතක්සේරු ගතව තිබුණි. මේ නිසා වර්ෂ දෙකේ ලාභයට සිදුවූ බලපෑම වන්නේ?

	2017.03.31	**2018.03.31 අවසන් වර්ෂය**
(1)	60 000 කින් වැඩිවීම	10 000 කින් අඩුවීම
(2)	60 000 කින් අඩුවීම	10 000 කින් වැඩිවීම
(3)	60 000 කින් වැඩිවීම	70 000 කින් වැඩිවීම
(4)	60 000 කින් වැඩිවීම	50 000 කින් වැඩිවීම
(5)	60 000 කින් අඩුවීම	70 000 කින් වැඩිවීම

09) පහත දැක්වෙන කුමන සිදුවීම නිසා අවිනිශ්චිත ගිණුමක් විවෘත කිරීම අවශ්‍ය වන්නේද?

(1) විකිණීම සඳහා මිලදී ගත් රු. 150 000 ක භාණ්ඩ ජංගම නොවන වත්කම් ගිණුමට හර කොට ණයහිමි ගිණුමට බැර කිරීම.
(2) රු. 50 000ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වලින් අත්හැරීම.
(3) ණයගැතියන්ගෙන් ලද රු. 100 000 ක මුදලක් රු. 10 000 ක් ලෙස මුදල් පාලන ගිණුමට හර කොට ණයගැති ගිණුමට බැර කිරීම.
(4) උපචිත කුලී රු. 25 000 ක් කුලී ගිණුමෙහි පමණක් සටහන් කිරීම.
(5) ණයහිමියන්ට ගෙවූ රු. 10 000 ක් ගැණුම් ගිණුමට පිටපත් කිරීම.

- පහත තොරතුරු ව්‍යාපාරයකට අදාල වේ.

2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 500 000
2018.03.31 දිනට ණයගැති ලෙජරයේ ශේෂයන්ගේ එකතුව රු. 400 000

A. විකුණුම් ජර්නලයේ එකතුව රු. 570 000 ක් ණයගැති පාලන ගිණුමෙහි සටහන් කර ඇත්තේ රු. 750 000 ක් ලෙසය.
B. බොල්ණය කපා හැරීම් රු. 20 000 ක් සහ දුන් වට්ටම් රු. 60 000 ක් ණයගැති පාලන ගිණුමේ පමණක් සටහන් කර ඇත.
C. බොල්ණය ලෙස කපා හල ණයගැතියෙකුගෙන් ලද රු. 40 000 ක මුදල මුදල් පොතට හර කර බොල් ණය ගිණුමට බැර කර ඇත

10) 2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමෙහි නිවැරදි ශේෂය කුමක්ද?

(1)රු. 400 000 (2)රු. 320 000 (3)රු. 240 000 (4)රු. 280 000 (5)රු. 360 000

11) ණයගැති ලෙජරය සමග ණයගැති පාලන ගිණුම සැසඳීමේ දී ඉහත A,B සහ C හි දී ඇති තොරතුරු අතරින් කුමක් ණයගැති සැසඳුමේ ගැලපිය යුතු ද ?

(1)A හා B පමණි (2)A හා C පමණි (3)B පමණි (4)C පමණි (5)A ,B සහ C ය

12) සමාගමක තොග සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

දිනය	විස්තරය	මුලු වටිනාකම රු. 000	ඒකක ගැණුම් මිල රු.	ඒකක විකුණුම් මිල රු.
2018.01.01	තොගය	1 500	15	-
2018.01.05	ගැණුම්	4 000	20	-
2018.01.10	විකුණුම්	3 500	-	35
2018.01.15	ණයගැතියන් විසින් ආපසු එවුම්	700	-	-
2018.01.20	ගැණුම්	2 500	25	-
2018.01.30	විකුණුම්	2 000	-	25

ප්‍රථම ලැබීම ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමයකට (FIFO) තොග නිකුත් කිරීම කරනු ලබයි.
2018.01.31 දිනට ඉතිරි තොග වටිනාකම හා 2018.01.31 දිනෙන් අවසන් මාසයට අදාල දළ ලාභය පිළිවෙළින්,

	ඉතිරි තොගය(රු. 000)		දළ ලාභය (රු. 000)
(1)	3 200	හා	4 100 කි
(2)	3 500	හා	5 500 කි
(3)	4 500	හා	3 100 කි
(4)	5 300	හා	2 100 කි
(5)	7 000	හා	4 500 කි

13) ජයටැඹ ව්‍යාපාරය මෝටර් රථ කුලියට දීමෙන් ආදායම් උපයා ගනී. 2018.03.31 දිනට සහ 2017.04.01 දිනට ගිණුමේ ශේෂ පහත දැක්වේ.

	2018.03.31 දිනට (රු.)	2017.04.01 දිනට (රු.)
කලින් ලැබු කුලී අත්තිකාරම්	250 000	200 000
ලැබිය යුතු කුලී අත්තිකාරම්	350 000	400 000

2018.03.31 දිනෙන් අවසන් වසර තුල මුළු කුලී ලැබීම් රු. 1 300 000 කි. 2018.03.31 දිනෙන් අවසන් වසරට අදාළ කුලී ආදායම,

(1)රු. 110 000 කි (2)රු. 155 000 කි (3)රු. 1 200 000 කි
(4)රු 1 300 000 කි (5)රු. 1 450 000 කි

14) කුමුදුගේ ව්‍යාපාරයේ 2017 මැයි මාසයට අදාළව පහත තොරතුරු සපයා ඇත.

මැයි 31 දිනට බැංකු ප්‍රකාශයේ අයිරාව	- රු. 72 000
ස්ථාවර නියෝග	- රු. 24 000
බැංකුවට කෙලින්ම ලද ලාභාංශය	- රු. 12 000
නිකුත් කල නමුත් ඉදිරිපත් නොවු චෙක්පත්	- රු. 54 000

ඉහත තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසු කුමුදුගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය වනුයේ,

(1)රු. 114 000 ක හර ශේෂයකි (2)රු. 30 000 ක බැර ශේෂයකි (3)රු. 114 000 ක බැර ශේෂයකි
(4)රු. 30 000 ක හර ශේෂයකි (5)රු. 18 000 ක බැර ශේෂයකි

15) සුළු මුදල් අග්‍රිම ක්‍රමය භාවිතා කරන ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 5 000 කි. මාසය ආරම්භයේ දිම අග්‍රිමය ප්‍රතිපුරණය කරන අතර ජනවාරි සහ පෙබරවාරි මාස දෙක සඳහා වෙන වෙනම ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරු වෙත ප්‍රතිපුරණය කර ඇති මුදල රු. 7 400 කි.
පෙබරවාරි මාසය ආරම්භයේ දි රු. 600 ක් සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබු අතර ජනවාරි මාසය ආරම්භයේ දි ප්‍රතිපුරණයට පෙර සුළු මුදල් භාරකරු සතුව වු මුදල වන්නේ,

(1)රු. 1 800 කි (2)රු. 2 000කි (3)රු. 2 400කි (4)රු. 3 000 කි (5) රු. 4 400 කි

16) එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් 2018.03.31 දින අත්පත් කරගත් යන්ත්‍රයකට පහත තොරතුරු අදාල වේ.

අයිතමය	රු.
VAT ඇතුලුව ගෙවූ මුදල	777 000
වරායේ සිට ව්‍යාපාර ස්ථානයට ප්‍රවාහනය කිරීමේ පිරිවැය	40 000
වැඩබිම සකස් කිරීමේ පිරිවැය	120 000
සවිකිරීමේ පිරිවැය	80 000
සමාරම්භක උත්සවයේ වියදම්	30 000
යන්ත්‍රයේ මූලික පරීක්ෂා කිරීමේ පිරිවැය	10 000

අදාල VAT අනුපාතය 11% කි

LKAS 16 (දේපල පිරියත සහ උපකරණ) ප්‍රමිතියට අනුව ආරම්භක හඳුනා ගැනීමේ දී යන්ත්‍රයේ පිරිවැය,

(1) රු. 931 530 (2) රු. 950 000 (3) රු. 971 530
(4) රු. 980 000 (5) රු. 1 027 000

17) එකතු කල අගය මත බදු (VAT) සදහා ලියාපදිංචි ව්‍යාපාරයක් වන සීමිත සුනිල් පොදු සමාගම 2016.04.01 දින රු. 6 720 000 කට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදි. මෙහි VAT සඳහා ගෙවූ මුදල රු. 720 000 අඩංගු වේ. මෙම යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වර්ෂ 12 ක් වන අතර එයට සුන්බුන් අගයක් නොමැත. LKAS 16 (දේපල පිරියත සහ උපකරණ) ප්‍රමිතියට අනුව 2018.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම කොපමණද?

(1)රු. 6 160 000 (2)රු. 5 500 000 (3)රු. 6 000 000
(4)රු. 5 800 000 (5)රු. 5 000 000

18) A සහ B හවුල් ව්‍යාපාරයේ A සහ B ප්‍රාග්ධන මත 10% පොලී ලබාදීම වේතන වාර්ෂිකව පිළිවෙලින් රු. 50 000 හා රු. 80 000 ගෙවීම සිදුවේ. 2018.03.31 දිනට A සහ B හවුල් ව්‍යාපාරයේ ජංගම ගිණුම පහත දැක්වේ.

000'

	A	B		A	B
ගැණිලි	100	120	ශේෂය 2017.04.01	300	420
අලාභ කොටස්	50	50	ණය පොලී	10	-
			වේතන	50	80
2018.03.31	310	480	ප්‍රාග්ධන පොලී	100	150
	460	650		460	650

මෙම ව්‍යාපාරයේ පැවැති ශුද්ධ ලාභය වන්නේ (රු. 000)

(1) 390 (2) 380 (3) 280 (4) 100 (5) (100)

19) 2018.03.31 දිනට A සහ B හිමිකම,

	A රු. 000	B රු. 000
1)	310	480
2)	410	530
3)	1300	1920
4)	1000	1500
5)	1310	1980

20) තාරකා ක්‍රිඩා සමාජයේ 2017.03.31 දිනට සාමාජික සංඛ්‍යාව 150 කි. ඉන් 50 දෙනෙකු යාවජීව සාමාජිකයින් ය. ඉතිරි එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1 000 කි. සාමාජිකයින් 12 දෙනෙකු 2016/2017 වර්ෂය සඳහා මුදල් ගෙවා නැත. සාමාජිකයින් 8 දෙනෙකු 2017/2018 වර්ෂය සඳහා ද මුදල් ගෙවා ඇත. යාවජීව සාමාජික මුදල් ගිණුමේ 2016.04.01 දිනට ශේෂය රු. 200 000 කි ඉන් 10% ක ප්‍රමාණයක් 2016/2017 වර්ෂයේ සාමාජික මුදල් ආදායම් ලෙස ආදායම් හා වියදම් ගිණුමට මාරු කරනු ලැබේ. වසර මුලදී හිඟ හිටි හෝ ඉදිරියට ලද සාමාජික මුදල් නොපැවතුණි.

2016/2017 වර්ෂය තුල ආදායම් ලෙස හදුනාගන්නා සාමාජික මුදල් වටිනාකම හා වර්ෂය තුල ලද සාමාජික මුදල කොපමණද?

ආදායම ලෙස හඳුනාගන්නා වටිනාකම (රු.)	වර්ෂය තුළ ලද සාමාජික මුදල (රු.)
(1) 96 000	120 000
(2) 120 000	100 000
(3) 120 000	96 000
(4) 120 000	120 000
(5) 150 000	96 000

21) LKAS 37 ප්‍රතිපාදන අසම්භව්‍ය වගකීම් හා අසම්භව්‍ය වත්කම් ගිණුම් ප්‍රමිතිය අනුව පහත කුමන ප්‍රකාශ / ප්‍රකාශය සත්‍ය වේද,

A. ප්‍රතිපාදනයන් යනු අතීත සිදුවීමට ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැදීමක් පවතින පියවීමේ දි සම්පත් පිටතට ගලා යයි. එහි කාලය හෝ ප්‍රමාණය අවිනිශ්චිත වේ.

B. ව්‍යාපාරයේ සම්පූර්ණ පාලනයෙන් තොරවූ එහෙත් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අසම්භව්‍යතා හඳුනා ගැනේ.

C. ප්‍රතිපාදන මූල්‍ය වාර්තා වල දැක්වේ.

D. ප්‍රතිපාදන මූල්‍ය වාර්තා වල නොදැක්වේ. එහෙත් සටහනක් ලෙස දක්වයි.

(1) A පමණි (2) A,C පමණි (3) A,B,C, පමණි (4) C,D පමණි (5) A,B,C,D සියල්ල

22) ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම හා වැරදි සම්බන්ධව ප්‍රමිතියට LKAS 8 අනුව පහත සඳහන් ඒවායෙන් ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත හැක්කේ කුමක්ද?

A. පෙර වර්ෂයෙහි කපාහරින ලද රු. 50 000 ක ණයගැතියකුගෙන් ණය ප්‍රවර්තන වර්ෂයේ දි ලැබීම.

B. තොග අගය කිරීම් FIFO (ප්‍රථම පැමිණි ප්‍රථම පිට) ක්‍රමය වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ සිට WAC (බර තැබූ සාමාන්‍ය පිරිවැය) ක්‍රමය යොදා ගැනීම.

C. ප්‍රවර්තන වර්ෂයේ සිට දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරීම සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරු කිරීම.

D. ගොඩනැගිලි නවීකරණය හේතුවෙන් එහි ඵලදායි ජීවකාලය වසර 10 සිට වසර 12 දක්වා වැඩිවන බව තීරණය කිරීම.

ඉහත සඳහන් ඒවායෙන් ඇස්තමේන්තු වෙනස් වීම් ලෙස හඳුනා ගැනෙන්නේ,

(1)A සහ C පමණි (2) A සහ D පමණි (3)A,B සහ C, පමණි
(4) A,C සහ D පමණි (5) B,C සහ D පමණි

- 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සඳුන් පොදු සමාගමට අදාල පහත තොරතුරු ප්‍රශ්න අංක 23 හා 24 ට පිළිතුරු සැපයීමට භාවිතා කරන්න.

විස්තරය	රු. 000
විකුණුම් අයභාරය	1 000
මෝටර් රථ ප්‍රත්‍යාගණය මත අතිරික්තය	200
සැපයුම්කරුගෙන් ලද වෙළඳ වට්ටම්	100
ගොඩනැගිල්ලක් විකිණීම මත ලාභය	300
මුලු වියදම	500

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රත්‍යාගණය මත රු. 150 000 ක හිඟයක් ඇති අතර සමාගම එය වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

23) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හඳුනාගත් මුළු ආදායම සහ වෙනත් විස්තීරණ ආදායම කොපමණද?

මුළු ආදායම	වෙනත් විස්තීරණ ආදායම රු. 000
(1) 1 450	50
(2) 1 500	50
(3) 1 500	200
(4) 1 600	50
(5) 1 600	200

24) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හඳුනාගත් මුළු විස්තීරණ ආදායම සහ රඳවා ගත් ඉපැයුම් කොපමණද?

මුළු විස්තීරණ ආදායම රු. 000	රඳවා ගත් ඉපැයුම් රු. 000
(1) 950	950
(2) 1 000	800
(3) 1 000	950
(4) 1 100	900
(4) 1 100	1 050

25) සීමිත පුබුදු පොදු සමාගමේ 2018.03.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

	රු. 000	
	හර	බැර
ආදායම් බදු ගෙවීම – 2017/2018	300	
2016/2017	285	
ආදායම් බදු සඳහා වෙන් කිරීම් 2016/2017		350

2016/2017 වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 325 000 විය යුතු බව දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමග එකග වී ඇත. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් බද්ද රු.350 000 ලෙස ඇස්තමේන්තු කර ඇත.

ඉහත තොරතුරු ඇසුරෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කළ යුතු නිවැරිදි අගයන් මොනවාද?

	ආදායම් බදු වියදම	ආදායම් බදු වගකීම
(1)	325 000	50 000
(2)	325 000	65 000
(3)	325 000	90 000
(4)	350 000	65 000
(5)	350 000	90 000

26) පහත දැක්වෙන කුමන දෑ සමාගමක මුළු හිමිකම් වෙනස් වීම සඳහා අදාල නොවේද?

A. කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම
B. උපචිත විගණන ගාස්තු සටහන් කිරීම
C. සංචිත ප්‍රාග්ධනිත කිරීම
D. හිමිකම් නිකුතුවක් සිදුකිරීම
E. සාමාන්‍ය කොටස් හිමියන්ට අවසාන ලාභාංශයක් යෝජනා කිරීම

(1 A සහ B පමණි (2) A සහ C පමණි (3)A සහ E පමණි
(4) B සහ C පමණි (5) C සහ E පමණි

- **පහත තොරතුරු උපයෝගි කරගෙන 27 ,28 ,29 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

දම්රෝ සමාගමේ මූල්‍ය තත්ත්ව උද්ධෘතය 000’

	2018.03.31	2017.03.31
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	13 000	13 000
සංචිත		
පොදු සංචිත	3 400	3 000
රඳවාගත් ඉපැයුම්	3 600	2 000
ජංගම නොවන වගකීම්		
15% ණය	2 000	2 000
ජංගම වගකීම්		
උපචිත බදු	100	80
වෙළෙඳ ගෙවිය යුතු දෑ	140	150

2018.03.31 ට ගෙවූ බදු 280 000 කි. ගෙවූ ලාභාංශ 1 000 000.

27) 2018.03.31 ට බදු පෙර ලාභය,

(1) 2 300 000 (2) 2 400 000 (3) 2 700 000 (4) 3 000 000 (5) 3 300 000

28) 2018.03.31 සදහා පොලී ආවරණ අනුපාතය,

(1) වාර 8 (2) වාර 9 (3) වාර 10 (4) වාර 11 (5) වාර 12

29) 2018.03.31 සදහා හිමිකමට ප්‍රතිලාභ අනුපාතය,

(1) 11% (2) 12% (3) 13% (4) 14% (5) 15%

30) සීමිත මීවිත සමාගම 2018.03.31 දිනෙන් අවසන් වසරට පහත තොරතුරු අදාල වේ.

විස්තරය	**රු 000**
රැඳවා ගත් ඉපැයුම් (17/4/1)	600
රැඳවා ගත් ඉපැයුම් (18/3/31)	1 800
ගෙවූ ලාභාංශ	200
ආදායම් බදු ගෙවීම්	100
වත්කම් ක්ෂය වීම	120
යන්ත්‍ර විකුණුම් ලාභ	40
බඩු තොග අඩුවීම	60
ණයගැති වැඩිවීම	110

LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ප්‍රමිතියට අනුව 2018.03.31 දිනෙන් අවසන් වසර සදහා මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය කොපමණද? (රු 000)

(1) 930 (2) 1 230 (3) 1 430 (4) 1 530 (5) 1 620

31) ව්‍යාපාරයක සිදුවී ඇති පහත ගණුදෙනු නිසා පහත මූල්‍ය ප්‍රකාශන මූලිකාංග වලට වන බලපෑම අඩුවේ. වැඩිවේ. වෙනස් නොවේ. ලෙස දක්වන්න.

	වත්කම්	වගකීම්	හිමිකම්
1. වගකීම් සහතික සදහා වෙන් කිරීම			
2. බැංකු අයිරාවක් පවතින විට ණයගැති සෘජු ප්‍රේෂණ ලැබීම			
3. කල්බදු වාරිකයක් ගෙවා දැමීම			
4. අඩමාණ ණය ලෙස වෙන්කර ඇති ණයගැතියෙකු බොල්ණය බවට පත්වීම			

32) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක ඇතුලත් සංරචක 4 ක් නම් කරන්න.

1. ....
2. ....
3. ....
4. ....

33) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

		රු.
සුළු මුදල් ගිණුම් ශේෂ	- 2018.01.01	600
	- 2018.01.31	400
ප්‍රතිපූර්ණය කිරීම	- 2018.01.01	1 900

සුළු මුදල් අග්‍රිමය රු. 500 කින් වැඩිකරමින් 2018.02.01 දින ප්‍රතිපූරණය කල මුදල කොපමණද?

34) පහත ගිණුම් වත්කම්, වගකීම්, ආදායම්, වියදම්, හිමිකම් ලෙස වර්ග කරන්න.

ගිණුම	වර්ගීකරණය
A. ක්ෂය සදහා වෙන් කිරීම	....
B. ඉදිරියට ගෙවූ ගෙවල් කුලී	....
C. ප්‍රත්‍යාගණන සංචිතය	....

D. ආපසු යැවුම් ……………………………………………..

35) පහත එක් එක් ගණුදෙණුව වාර්තා කිරීම සඳහා සුදුසු මූලාශ්‍ර ලියවිල්ල හා මූලික සටහන් පොත දක්වන්න.

ගණුදෙනුව	මූලාශ්‍ර ලියවිල්ල	මූලික සටහන් පොත
A. ලිපි ද්‍රව්‍ය ණයට ගැණුම්	………………………………………..	………………………………………..
B. සැපයුම්කරුන්ට ආපසු යැවුම්	………………………………………..	………………………………………..
C. ණයගැති ප්‍රේෂණ	………………………………………..	………………………………………..
D. තැන්පත් කල චෙක්පතක් අගරු වීම	………………………………………..	………………………………………..

36) පහත සඳහන් තත්ත්වයන් සඳහා වඩාත් අදාල ගිණුම්කරණ සංකල්පය හඳුනා ගන්න,

ගණුදෙණුව	අදාල ගිණුම්කරණ සංකල්පය
A. වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම.	………………………………………..
B. ගැණුම් වලින් කොටසක් විකුණුම් පිරිවැය ලෙසත් ඉතිරි කොටස වත්කම් ලෙස හඳුනා ගැනීම.	………………………………………..
C. පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගය මත තොග ගණනය කිරීම.	………………………………………..
D. අඩමාණ ණය සඳහා වෙන්කිරීම ගැලපීම.	………………………………………..

37) ක්‍රීඩා සමාජයක සාමාජික මුදල් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2018.03.31 ට රු.	2017.03.31 ට රු.
උපචිත සාමාජික මුදල්	80 000	120 000
කලින් ලද සාමාජික මුදල්	30 000	70 000

2018.03.31 දිනෙන් අවසන් වසර සඳහා සාමාජිකයන් 70 දෙනෙකු සිටින අතර සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1 000 කි.

1. මුදලින් ලද සාමාජික මුදල කොපමණද?
2. වසරේ සාමාජික මුදල් ආදායම කොපමණද?

38) ව්‍යාපාරක් විසින් 17/18 ගිණුම් වර්ෂය තුලදී විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවා ඇති භාණ්ඩ වල විකුණුම් වටිනාකම රු. 800 000 ක් වූ අතර ලාභ ප්‍රතිශතය පිරිවැයට 25% කි. වසර තුලදී යැවූ භාණ්ඩ වලින් 3/5 ක් විකිණිමට ඇති අතර සියළු භාණ්ඩ ණයට විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. ගැලපුම විසඳූ පසුව අයිතමයන්ට ඇතිවෙන බලපෑම වටිනාකම සමග දක්වන්න.

1. විකුණුම් ……………………………………………………………………………………………………
2. ණයගැතියෝ ……………………………………………………………………………………………………
3. ඉතිරි තොගය ……………………………………………………………………………………………………

- **ප්‍රශ්න අංක 39 හා 40 සඳහා අදාල තොරතුරු පහත වේ.**

  පහත සඳහන් තොරතුරු ව්‍යාපාරයක වත්කම් 2 ක් හා සම්බන්ධ වේ.

වත්කම්	පිරිවැය	ඵලදායි ජීව කාලය (වසර)	සුන්බුන් අගය රු. (000)	2017.04.01 දිනට සමුච්චිත ක්ෂය
මෝටර් රථය	4 000	10	400	1 800
යන්ත්‍රය	2 000	5	200	720

- 2017.04.01 දින මෝටර් රථ වැඩි දියුණු කිරීම සඳහා රු. 600 000 ක් වැය කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථයේ ඉදිරි ඵලදායි ජීව කාලය වසර 06 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. සුන්බුන් අගය වෙනස් නොවේ.
- 2018.03.31 දින ව්‍යාපාරයේ පැවැති යන්ත්‍රය රු. 1 500 000 විකුණන ලදි.

39) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ වාර්ෂික ක්ෂය වටිනාකම කොපමණද?

40) යන්ත්‍රය ඉවත් කිරීමේ ලාභය / අලාභය කොපමණද?

41) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත පර්ල් සමාගමට අදාලව තොරතුරු පහත දි ඇත.

	රු.
වර්ෂය සඳහා ලාභය	900 000
වර්ෂය සඳහා ක්ෂය	150 000
තොගයේ වැඩිවීම	120 000
ණයගැතියෙකුගෙන් අඩු වීම	200 000
ණයහිමියන්ගේ වැඩි වීම	180 000
උපචිත වියදම් වැඩිවීම	20 000

2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගම් මෙහෙයුම් කටයුතු තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

42) හිරු, සඳු හා තරු 3:2:1 ලෙස ලාභාංශ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2018.01.01 දිනට පැවැති ශේෂය හා හවුල් ගිවිසුමේ කොන්දේසි මෙසේය. රු. 000

	හිරු	සඳු	තරු
ප්‍රාග්ධන ගිණුමේ ශේෂය	300	200	100
ජංගම ගිණුමේ ශේෂය	(50)	40	30

1) සෑම හවුල්කරුවෙකුටම වාර්ෂික රු. 60 000 ක වේතනයක් හිමි වේ.
2) වාර්ෂිකව රු. 40 000 ක උපරිමයකට යටත් ව ගැනිලි සිදු කල හැක.

අතිරේක තොරතුරු,

i. 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 500 000 කි.
ii. හිරු, සඳු හා තරු අනුපිලිවෙලින් රු. 30 000 ක් රු. 25 000 ක් රු. 20 000 ක් ගැනිලි සිදු කර ඇත .
iii. තරු රු. 20 000 ක් වේතන ලෙස ලබාගෙන ඇත .

2018.12.31 දින තරු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගෙන තම ප්‍රාග්ධන කොටස ණය ගිණුමකට මාරු කිරීමට එකග වූයේ නම්, තරුගේ හිමිකම ණය ගිණුමක මාරු කිරීමට අදාල ජර්නල් සටහන වනුයේ,

....

....

43) පහත සඳහන් තොරතුරු 31.03.2018 අවසන් වර්ෂය සඳහා අදාල ආයතනයක ණයගැතියන්ගේ තොරතුරු වේ.

	රු.
2017.04.01 ණයගැති ශේෂය	120 000
2018.03.31 ණයගැති ශේෂය	180 000
වර්ෂය සඳහා බොල්ණය ලියා හැරීම	4 800
කපා හල බොල් ණය නැවත ලැබීම	6 000

සෑම වර්ෂයක් අවසානයේ දීම ණයගැති අවසාන ශේෂය මත 4% ක් අඩමාණ ණය සඳහා ඉඩ හරියි.

1) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බොල්ණය සහ අඩමාන ණය වියදම ගණනය කරන්න.

....

2) 2018.03.31 දිනට ණයගැති ශුද්ධ වැඩිවීම හෝ අඩුවීම දක්වන්න.

....

44) පහත තොරතුරු සමාගමක් පරිභෝජනය කරනු ලබන P නැමැති අයිතමයට අදාල වේ.

කාර්තුවක ඉල්ලුම ඒකක 3000
ඇණවුමක පිරිවැය රු 300
ඒකකයක් රඳවා ගැනීමේ පිරිවැය රු 80

පහත දෑ ගණනය කරන්න

1) මුළු ඇණවුම් පිරිවැය
2) මුළු රඳවා ගැනීමේ පිරිවැය

45) R නැමැති ද්‍රව්‍ය සම්බන්ධව පහත තොරතුරු ඔබට සපයයි.

සාමාන්‍ය පරිභෝජන ඒකක	500
අවම පරිභෝජන ඒකක	250

උපරිම තොග මට්ටම ඒකක 34 500
උපරිම ඇණවුම් කාලය දින 42
අවම ඇණවුම් කාලය දින 28

පහත දෑ ගණනය කරන්න.

1) යළි ඇණවුම් මට්ටම
2) යළි ඇණවුම් ප්‍රමාණය

- සමාගමක් 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදි කොටසක් රු. 25 බැගින් කොටස් 300 000 ක් නිකුත් කිරීමට අයදුම්පත් කැඳවන ලදි. කොටස් 600 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. සියලුම අයදුම්කරුවන් අතර කොටස් සමානුපාතිකව විභාජනය කරන ලදි. කොටස් නිකුතු වියදම් ලෙස රු. 50 000 ක් දරන ලදි.

46) I) අයදුම්පත් සමග ලද මුදල වාර්තා කිරීමට ජර්නල් සටහන දක්වන්න

....

....

II) කොටස් විභාජනය කල අනුපාතය දක්වන්න.

47) I) අයදුම්කරුවන්ට ආපසු හරවා යැවූ මුදල රු. ....

II) ඉහත ගණුදෙණු නිසා හිමිකමේ ශුද්ධ වැඩිවීම රු. ....

48) ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි (LKAS 08) ප්‍රමිතිය පරිදි ආයතනයකට ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කල හැකි අවස්ථා 02 ක් සඳහන් කරන්න.

1. ....
2. ....

- **49 -50 ප්‍රශ්න වලට පිළිතුරු ලිවීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

සීමිත නන්දු සමාගම 2016.04.01 දින ඔරෙක්ස් ලීසිං සමාගමෙන් රු. 390 000 ක් වටිනා මෝටර් රථයක් කල්බදු ගිවිසුමක් යටතේ මිලදී ගන්නා ලදි. මූලික තැන්පතුව රු. 45 000 ක් 2016.04.01 දින ගෙවන ලදි. ඉතිරිය රු. 91,020 බැගින් වාර්ෂික වාරික 5 කින් ගෙවීමට එකග විය. පොළිය වාර්ෂිකව 10% කි.

49) 2016/2017 , 2017/2018 වර්ෂ දෙක සඳහා කල්බදු ගැණුම්කරුගේ පොත්වල කල්බදු ණය හිමි ගිණුම පිළියෙල කරන්න.

50) 2018.03.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දැක්විය යුතු ජංගම වගකීම සහ ජංගම නොවන වගකීම සඳහන් කරන්න.